# බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

*ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.*



ඉංග්‍රීසි පාලන යුගයේ දී කොළඹ පිටකොටුවේ දර්ශණයක්




## තල්, පොල් සහ මුතු පබා

**5 වැනි කොටස**

ශ්‍රියා කුමාරසිංහ නවසීලන්තයේ සිට

*එහිදී තුන් වන ජෝන් රජු විසින් සිංහල කුමාරයෙකුගේ රූකඩයකට දොන් ජුවන් යන නාමය යටතේ ගාම්භීර ලෙස ඔටුන්නක් පළඳවා, එමගින් එතැන් සිට රාජකීය අනුග්‍රහය දෙන බවට ප්‍රතිඥා කරවා ගන්නා ලදී. මෙම පෘතුගීසි රූකඩයට එරෙහිව සිංහයින්ගේ රජා, රාජසිංහ ගේ නොසංසිඳෙන වෛරය හේතුකොට ගෙන ඇතිවූ කරදර සුළුපටු නොවේ. වරක් ඔහු නුවර ආසන්නයේදී පෘතුගීසින් 1700 ක් කඩු ගා දමා ඔවුන් දැඩි පසුබෑමකට ලක් කළේ ය.*

**වරින් වර** ඇතිවූ යුද හා කැරලි කෝලාහල මධ්‍යයේ තවත් සියවස් ගණනාවක් ගත වී ගියේය. එම කාලය අතර තුර අනුරාධපුර නගරය සෙමෙන් එහෙත් නිසැකවම පරිහානිය කරා ගමන් කලේය. දැන් අප එළඹෙන්නේ රජ වාසල පොලොන්නරුවට සංක්‍රමණය වූ ක්‍රිස්තු වර්ෂ අටවැනි සියවසටයි. මෙම සංක්‍රමණය අනුරාධපුර යුගයේ පරිහානියට තුඩු දුන් එකම හේතුව නොවේ. ඉන්දියානු ආක්‍රමණ, මලයාලි කොල්ලකරුවන්ගෙන් නොකඩවා එල්ල වුණු ප්‍රහාර, නිරන්තර කැරලි හා මහජන කැළඹිලි ආදී සියල්ල එයට එකතු විය. සියවස් හතරකට පසු ලංකාවේ ඉපැරණි ශ්‍රී විභූතිය නැවත නගා සිටුවීමට 1වන පරාක්‍රම රජු සමත් විය. ඔහු, රටේ රණවිරු ඉතිහාසයේ අනෙකුත් සියළුම නායකයින්ට වඩා කැපී පෙණුන ප්‍රබල පාලකයෙකි. රණකාමියෙකු ලෙස පමණක් නොව, ආගමික ඥාණය, ව්‍යාකරණ, තර්ක ශාස්ත්‍රය, අසුන් පිට යාම, දුනු ශිල්පය, කාව්‍යකරණය හා සංගීතය ආදි විෂයයන්හි ද හසල දැනුමක් තිබුණ අයෙකි. ඉතා උසස් පැවතුම් ඇති කුමරෙකු වූ ගජබාහු, පරාක්‍රමට ඉඩ දෙනු වස් සිය කැමැත්තෙන්ම පදවිය අත් හැරියෙන්, සිය රාජධානියේ සෞභාග්‍යය නැවත නගා සිටුවීම උදෙසා කල හැකි සෑම දෙයක්ම කරමියි පරාක්‍රම රජු දැඩි ලෙස සනිටුහන් කර ගත්තේය. රජ වාසලට කප්පම් ගෙවන කුඩා රාජ්‍යයක් හෙබවූ බල ලෝභී සුහලා කුමරිය පරාක්‍රම රජුගේ එම ප්‍රතිසංවිධාන කටයුතු වලදී ඊට එරෙහිව කැරලි ගැසූවෙන්, රාජකීය හමුදාවේ ප්‍රධානියා වු රාබ එය මැඬ පවත්වීය. සුහලා සම්පූර්ණයෙන්ම යටත්වූයෙන් ඇයට ජීවිත දානය දෙනු ලැබීය. පරාක්‍රම රජුගේ පොලොන්නරු රාජධානියේ ඉදිකිරීම් කටයුතු යම්තම් නිමවනවාත් සමගම සූහලා නැවත ආයුධ අතට ගත්තී එවරද පරාජය වුවාය. නමුත් මෙවර ඇගේ ප්‍රතිවාදියා අතින් ඇයට හිමි මරණය උදා විය.

අදිකාරම් කෙනෙකු යටතේ ගවේෂණ කණ්ඩායමක් කාම්බෝජයට පිටත් කර යැවීමෙන් අනතුරුව, එහි කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත බුරුමයම යටත්වීම හා එය ලංකා රාජ්‍යයට ඈඳා ගැනීම හැරුණ විට, ඉන් පසුව ගෙවුණ පරාක්‍රම යුගය සාමකාමීව ගෙවුණි. මෙයට එකතු කල යුතු තවත් යමක් ඇත. එනම්, පරාක්‍රම රජුගේ අවසාන, එමෙන්ම විශිෂ්ටතම යුද ජයග්‍රහණය ලෙස මුළු මහත් මලබාර් දේශයත්, කොරොමන්දාරු දේශයත් යටත් කර ගෙන, එහි රජු වශයෙන් සිය පුතණුවත් පත් කර යැවීමය. 1186දී පරාක්‍රම රජු මිය ගියේය. ඔහුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් දෙවන පරාක්‍රම 1211දී සමස්ත දිවයිනේම රාජ්‍ය පාලකයා වශයෙන් පත්වෙන තුරු දීර්ඝ කාලයක් රට අරාජිකව පැවතියේය. අවුරුදු 500කට ආසන්න කාලයක් පොලොන්නරුව අග නගරය ව තිබී පසුව එය අත් හැර දමා රජ වාසල ගම්පොලට ගෙන යන ලදුව එතැනින් කෝට්ටේ ට හා ඉනික්බිතිව නුවරට ගෙන යන ලදී.

මීළඟ සියවස තුල සිදුවූ වැදගත්ම සිදුවීම නම් 1303 දී මලබාර්වරුන් විසින් බුදුන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුව පැහැර ගෙන යාමයි. එය අවුරුදු කිහිපයක් ඔවුන්ගේ රටේ තිබුණි. 1408 දී චිං-ත්සූ නම් වු මිං පරපුරේ චීන අධිරාජයා, දළදා මාලිගයේදී සිය රටවැසියන්ට වු අවමානයකට දඬුවම් කරනු වස් ගවේෂණ කණ්ඩායමක් එවන ලදුව, ඔවුන් විසින් විජය-බාහු රජ චීනයට රැගෙන යන ලදී. දළදා වහන්සේද ඒ සමග ගෙන ගිය බව සමහරුන්ගේ මතයයි. අවුරුදු කිහිපයකට පසුව සිරකරුවන් නිදහස් කරන ලද අතර දඬුවම් වශයෙන් අවුරුදු 50ක් චීනයට කප්පම් ගෙවීමට ලංකාවට සිදු විය.

මේ වන විට විවිධ චාරිකා වලදී ලංකා වෙරළට ගොඩබට සංචාරකයින්ගේ චාරිකා සටහන්වල දිවයිනේ නම නිතර නිතර දක්නට ලැබුණි. 1501 දී නිකොලො ඩි කොන්ටි නම් ඉතාලි ජාතිකයා දිවයින ගැන සඳහන් කරමින්, සැතපුම් 3000ක වට රවුමකින් යුතු, විශාල වශයෙන් මැණික් උපදින, කුරුඳු නිපැයෙන උතුම් දිවයිනක් බවත්, ඉහතදී බ්‍රහ්මීන් විසින් පාලනය කරන ලද බවත්, විශාල විලක් මැද සැතපුම් තුනක වට රවුමෙන් යුතුව නගරය පිහිටා ඇති බවත් කියයි. රුසියානු ජාතිකයෙක් පවසන පරිදි, එය ඉන්දීය සයුරේ නැව් තොටකි. ඇන්ටිමනි, අගස්ති, පළිඟු, සූම්බඩ ඉතා ළඟින් සොයා ගත හැක. බෙල්ලන් කිලෝ ගණනින්ද අලි ඇතුන් විවිධ ප්‍රමාණ වලින්ද ලබා ගත හැකිය. පසු කලෙක මැගලන් සමග ලොව වටා යාත්‍රා කල පෘතුගීසි ජාතික බාර්බෝසෝ ලංකාව ගැන මෙසේ විස්තර කරයි. යුදෙව් නොවන රජෙකු විසින් පාලනය කරනු ලබන, යුදෙව් නොවන මිනිසුන් කොට්ඨාශයක් වාසය කරන, ධනවත්, සම්පත් බහුල රටකි. මෙකී අන්‍ය ගෝත්‍රිකයෝද, මරක්කලයෝද මනාව වැඩුණු ශරීර ඇති, බොහෝ දුරට සූදට ආසන්න ඡවි වර්ණයෙන් යුතු, උස, තරබාරු මිනිස්සුය. උඩු කය නිරාවරණය. කපු හිස් පළඳනා සහ සේද ඇඳුම් අඳිති. විශාල කරාබු පළඳිති. ඉතා රසවත් පලතුරු බහුලව ඇත. සමහර වර්ග වෙන කිසිදු තැනක හමු නොවේ. හොඳ ඇතුන් ඩුකට් 1000 හෝ 1500 තරම් වටිනාකමකින් යුතුය.

පෘතුගීසීන් ඒමට පෙර පරම්පරා ගණනාවක් තිස්සේ ලංකා ඉතිහාසය පරිහානියට ලක් වෙමින් පැවතියේය. අභ්‍යන්තර අරගල සහ බාහිර ආක්‍රමණ වලට අමතරව, මහජනයා අතර වර්ධනය වූ උදාසීනතාවය ආදිය එහි පසු බැස්මට හේතුවු මූලික කරුණු අතර වේ. දිවයිනේ මිල කල නොහැකි වටිනාකම නිසා මරක්කලයින්, මලබාර් වරුන් සහ මැලේ ජාතිකයින නොකඩවා ඇදී ආහ. කාලයාගේ ඇවෑමෙන් ඉතිරි වූයේ රටේ මුල් ස්වරූපයේ ඡායාවක් පමණි.

1505 දී පෘතුගීසින් විසින් දිවයින යළි සොයා ගනු ලැබිණ. ගෝවේ ආණ්ඩුකාරයාගේ පුතා වූ ලොරෙන්සෝ ද අල්මේදා මාල දිවයින් අසල මුහුදු චාරිකාවක යෙදී සිටියදී බටහිර දිග සුළඟට හසුවී කොළඹට ගසා ගෙන ගොස් ඇත. කොළඹ යන නම පෘතුගීසින් විසින් තබා ඇත්තේ එම නැවේ නැව් පතියාට ගරු කිරීමක් වශයෙනි. පොලොන්නරුවේ රජ වාසලට මෙම අමුත්තන්ගේ පැමිණීම සැල වුයේ මෙසේය. රජ තුමාගේ වෙරළ තීරයට සුදු පැහැය පරදවන සුදකින් යුතු දැකුම්කළු මිනිසුන් වර්ගයක් පැමිණ ඇත. ඔවුහු යකඩ වලින් තැනූ සපත්තු සහ තොප්පි පැළඳ සිටිති. මොහොතක් හෝ එක තැන සිටීමට ඉස්පාසුවක් නැති සේය. ඔවුන් සතුව ඇති බට වලින් යුගන්දර පරුවතයට අකුණු සැර වැදුණ කලක මෙන් හඬක්, නැත්නම් ඊටත් වඩා වැඩි හඬක් පිටවේ. ඉන් එකකින් පිට වන යකඩ ගුලියක් ගව් ගණනාවක් දුර පියඹා ගොස් කිරි ගරුඬ වලින් හෝ යකඩ වලින් තැනූ මාලිගයක් වුවද කඩා බිඳ දැමීමට සමත්ය. ඒ වන විටත් දිවයින අල්ලා ගෙන පෘතුගාලයේ රජුට එහි අයිතිය හිමි වීම සමරනු වස් කුළුණක්ද තනා අභවර වී සිටි අමුත්තන් පිරිස මිත්‍ර ශීලී ලෙස පිළිගනු ලැබිණ. නිසැකයෙන්ම එය මෙතෙක් වාර්තා ගත වී ඇති පරිදි, අපේ කාලයේ පෙනෙන්නට තිබෙන අවිනීත කමින් හා මහන්තත්වයෙන් ඔද වැඩුණ පෘතුගාලය විසින් කිසිදු කලබලයකින් තොරව කරන ලද රටවල් අල්ලා ගැනීම් වලින් එකක් විය යුතුය.

1518 දී පෘතුගීසින් විසින් රට වැසියන්ගේ බලවත් විරෝධතාවය නොසලකා කොළඹ කොටුවක් සෑදූහ. එය හේතු කොට ගෙන ඔවුන්ට ඉතා දරුණු, එහෙත් අසාර්ථක ප්‍රහාර කිහිපයකටම මුහුණ දීමට සිදු විය. අවුරුදු 20කට පසු, කැළඹිලි වල තාවකාලික විරාමයකදී, ලිස්බන් නගරයේ කුතුහලය දනවන උත්සවයක් පැවැත්වුණි. එහිදී තුන් වන ජෝන් රජු විසින් සිංහල කුමාරයෙකුගේ රූකඩයකට දොන් ජුවන් යන නාමය යටතේ ගාම්භීර ලෙස ඔටුන්නක් පළඳවා, එමගින් එතැන් සිට රාජකීය අනුග්‍රහය දෙන බවට ප්‍රතිඥා කරවා ගන්නා ලදී. මෙම පෘතුගීසි රූකඩයට එරෙහිව සිංහයින්ගේ රජා, රාජසිංහ ගේ නොසංසිඳෙන වෛරය හේතුකොට ගෙන ඇතිවූ කරදර සුළුපටු නොවේ. වරක් ඔහු නුවර ආසන්නයේදී පෘතුගීසින් 1700 ක් කඩු ගා දමා ඔවුන් දැඩි පසුබෑමකට ලක් කලේය. රාජසිංහ 1592 දී අවුරුදු 100කට ආසන්න වයසේදී, කඩුගන්නාව පසු කරද්දී ඇතිවූ සටනකින් පැරදී මරා දමන තෙක්ම, තමා ඉදිරියට එන සියළු සතුරන් පරදවමින් ඉදිරියටම ගියේය. මුල සිට අවසානය දක්වාම, සිය අණසක පවතින ප්‍රදේශයට ඇතුළු වන කවර තරාතිරමේ ආක්‍රමණිකයෙකුට වුවද, ජය ගැනීමට දුෂ්කර ප්‍රතිවාදියෙකු වු ඔහු විශිෂ්ට පුද්ගලයෙකි. කඩුගන්නාව අද නුවර කොළඹ මාර්ගය ආසන්නයේ පිහිටි නිසංසල වටපිටාවකින් යුතු දුම්රිය පොලකි. ලංකාවේ කිතු ගොස යුරෝපයට ළඟා වූයේ 17 වන සියවසේ මුල් භාගයේදිය. පර්චාස් විසින් ලියන ලද වන්දනා ගමන නම් වු ග්‍රන්ථයේ එම තොරතුරු මෙසේ කැටි කොට දක්වයි. තුසරය තුල මැවෙන දෙව් විමන්, සුවඳැති නැවුම් බවක ගිලී ඇති ප්‍රසන්න වටපිටාව, එහි ඇති ගංගා උල්පත් රාශියේ ගලා හැලෙන දිය දහරා, උසට නැගී ඇති කඳු, පහත් වු මිටියාවත්, සමානව හා නොවෙනස්ව පැතිරෙන තෝතැනි ආදියෙන් මවන භූ විෂමතා, ඇගේ ඇතුළු ගැබ පුරා ඇති ලෝහ සහ මැණික්, ඇගේ බාහිර ස්ථරය හා මුහුණ වසා අසුරා ඇති ඉස්තරම් කුරුඳු, ඊට අමතරව, ස්පාඤ්ඤයේ ඒවා පරදවන පලතුරු, දොඩම්, දෙහි ආදී දෑ, හීලෑ සතුන් මෙන්ම කැලෑවේ වෙසෙන කුකුළන් හා සිවුපාවුන්, ලෝකයේ අන් සියළු අලි ඇතුන් පරදවන උසස්තම කුලයේ අලි ඇතුන්, ආදී මේ සියල්ල රහසේ එකට එකතු වී, සෙයිලාන් වෙත දායාද කර ඇත. ලෝකයේ ඇති උපරිම සම්පත්, රසාස්වාදනයන් සහ දීර්ඝවූත් නිරෝගී වූත් ජීවිත කාලයක් විඳ ගැනීමේ අවස්ථාව එහි රටවැසියන්ට තිබේ. අන් පාරාදීසයකදී යමෙක් ඉඳුරන් පිනවීමට පැකිලේ නම් එය පුදුමයට කරුණක් නොවේ.

මීළඟට එළඹෙන්නේ විශාල වෙනසක උදාවයි. 1639 දී, තවත් සිංහ නමැත්තෙකු, සිය මුතුන් මිත්තන් ලබා ගත් ජයග්‍රහණ ලබා ගැනීමට තරම් ශක්තිමත් නොවූයෙන්, ලන්දේසීන්ගේ උදව් ඉල්ලා බතාවියා වෙත යැවූ විට, ඔවුහු වහා පැමිණ පළමු කොට මඩකලපුව හා තිරිකුණාමලය අත්පත් කර ගත්හ. වැඩි කල් නොයවාම මීගමුව සහ ගාල්ලද ඔවුන්ට අයිති විය.

අවුරුදු කිහිපයක් තිස්සේ අතන මෙතන පැන නැගුණ යුද තත්වයන් යටතේ රටේ එහා කොණේ සිට මෙහා කොන දක්වා සාමය බිඳ වැටී අවසානයේ 1658 දී දිගු කාලයක් තිස්සේ වට කර ගෙන සිට කොළඹ කොටුව අල්ලා ගැනීමෙන් සියල්ල අවසන් වුණි. මේ කාලය තුල දැඩි ආහාර හිඟයක ඇති වුයෙන්, අවසානයේදී පෘතුගීසි රැකවලුනට මිනී මස් කා දිවි රැක ගැනීමේ ත්‍රාසජනක අත් දැකීමට ද මුහුණ දීමට සිදු විය. යාපනයද ලන්දේසින් අතට පත් විය. ඒ සමග අවුරුදු 153 ක කාලයක් පුරා පැවති පෘතුගීසි පාලනයද නිමාවට පත් විය. මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණක් නම් අවුරුදු 137 ක ඇවෑමෙන් ලන්දේසි සමය අහෝසි වී යද්දී එහි සියළු සළකුණු ද මැකී ගොස් ඇති බවය. එහෙත්, පෘතුගීසි විවිධ ස්වරූපයෙන් තවම රැඳී සිටී. සුපරීක්ෂාවෙන් බැලුව හොත් ඉන්දු-පෘතුගීසි භාවිතය අඩු තරමින් මුහුදු බඩ තීරය ඔස්සේ හා රට ඇතුලත සමහර දිස්ත්‍රික්කවල භාවිතා වෙතත්, ලන්දේසි භාවිතයේ ඇත්තේම නැත. එක පැත්තකින් රෝමානු කතෝලික පල්ලිය ආගම සම්බන්ධ මහාචාර්ය වරු සමග ආරවුල් වලට පැටලී සිටි අතර අනෙක් අතින් ප්‍රතිසංවිධානය වු ලන්දේසි පල්ලි තිබුණද ඒ අතලොස්සක් පමණ වූ සුළු ප්‍රමාණයකි. කෙසේ වෙතත් පෘතුගීසින්ගෙන් පැවතෙන්නන් ක්‍රියාකාරී පුහුණු ශ්‍රමික පංතියට පමණක් සීමා වී ඇති අතර, රාජ්‍ය සිවිල් සේවයට අනුයුක්ත වු ලන්දේසි බර්ගර්වරුන් සංඛ්‍යාව සුළු නොවීය. අළුත් අමුත්තන් වඳුරා සහ කේක් කැබැල්ලේ උපමාව නැවත රඟ දැක්වීමට සූදානම් වන ආකාරය සිංහගේ සිත් නොගත්තේය. කිසිවෙකුටවත් වැලැක්විය නොහැකි තරම් ප්‍රබලයෙකු වු ඔහු ව නම්මවා ගැනීම කෙසේවත්

26 වන පිටට